www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානු ආන්ඩුව ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම ක්‍රියාවට දමනු පිනිස වාම පෙරමුන සමග සන්ධානයෙන් බිඳීමට සැලසුම් කරයි

**India's government plots break with Left Front to implement Indo-US nuclear treaty**

**කීත් ජෝන්ස් විසිනි**
**2008 ජුනි 21**

වොෂිංටනයෙන් හා ඉන්දියාවේ සංගත ප්‍රභූවෙන් එල්ල වන පීඩනයට හිස නමා, ඉන්දියාවේ එක්සත් ප්‍රගතිශීලී සන්ධාන (යූපීඒ) ආන්ඩුව ඉන්දු-එක්සත් ජනපද සිවිල් න්‍යෂ්ටික ගිවිසුම ක්‍රියාවට දමනු පිනිස නව ව්‍යායාමයක් දියත් කොට තිබේ.

යූපීඒ සන්ධානයේ අධිපති හවුල්කරුවා වන කොංග්‍රස් පක්ෂයේ නායකත්වය, නැතහොත් අඩු ගනනේ කොංග්‍රස් පක්ෂ නායකත්වයේ කොටසක්, අගමැති මන්මෝහන් සිං වටා රැලි වීගෙන සංඥා කොට ඇත්තේ, න්‍යෂ්ටික ගිවිසුම ඉදිරියට ගෙන යනු පිනිස ආන්ඩුවේ පාර්ලිමේන්තු බහුතරය අහිමි වීමේ හා නියම කලට පෙර හදිසි මැතිවරනයකට මුහුන දීමේ අවදානම දැරීමට තමන් සූදානම් බව යි.

එවන් ක්‍රියාමාර්ගයක් යූපීඒ සන්ධානය සහ ඉන්දියානු ධනේශ්වරයේ සම්ප්‍රදායික පාලක පක්ෂය වන කොංග්‍රසය යන දෙක ම දැඩි අවදානමක හෙලනු ඇත. උද්ධමනය සියයට 11ට ඉහල අගයකට, එනම් වසර 13ක් තුල පැවති ඉහල ම අගයට, තල්ලු කරමින්, පසුගිය හය මසක කාලය තිස්සේ ආහාර හා ඉන්ධන මිල ගනන් තියුනු ලෙස ඉහල නැග තිබේ. ඒ අතරතුර ආර්ථික වර්ධන වේගය අඩු වී ඇත. මෑත පැවති ප්‍රාන්ත මැතිවරනවල දී. කොංග්‍රසය පරාජයන් මාලාවක් අත්විඳ තිබේ. සන්ධානයේ පාර්ශ්වකරුවන්ගෙන් බොහොමයක් නිසි කලට පෙර මැතිවරනයක් පැවැත්වීමට විරුද්ධ හා එවැන්නකට බිය බව දන්නා තතු යටතේ, එවන් හදිසි මැතිවරනයක් යූපීඒ තුල ඝර්ෂනයන් වැඩි දියුනු කරනු ඇත.

ඒ කෙසේ වෙතත්, එය න්‍යෂ්ටික ගිවිසුම ඉදිරියට ගෙන ගිය හොත් තමන් සුලුතර යූපීඒ ආන්ඩුවට දෙන සහයෝගය ඉවත් කර ගන්නා බවට ස්ටැලින්වාදීන්ගේ නායකත්වයෙන් යුත් වාම පෙරමුන දරන තර්ජනයන් හමුවේ කොංග්‍රසය හා එහි යූපීඒ සගයන් දන නැමුව හොත්, තමන් අගමැති තනතුරෙන් ඉල්ලා අස් වන බවට මන්මෝහන් සිං තර්ජනය කර ඇතැයි වාර්තා වේ. (සිං ආන්ඩුවේ නායකත්වය දැරුවා වුවත්, ඔහු අගමැති ලෙස සිය තනතුර දරන්නේ කොංග්‍රස් පක්ෂ සභාපතිනිය හා නේරු-ගාන්ධි පෙලපතේ වත්මන් නායිකාව වන සෝනියා ගාන්ධිගේ කැමැත්තට යටත්ව ය.)

“ඉන්දියා-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම සමග ඉදිරියට යා යුතු බවට අගමැති මන්මෝහන් සිං කොංග්‍රස් පක්ෂයේ සභාපතිනි සෝනියා ගාන්ධි මත හැකි උපරිම පීඩනය යොදමින් සිටින්” බව කොංග්‍රසයේ අභ්‍යන්තර කොටස් පවසන්නේ යැයි බ්‍රහස්පතින්දා හැන්දෑවේ *rediff.com* වෙබ් අඩවියේ පල කෙරුනු ලිපියක් වාර්තා කලේ ය.

එය තව දුරටත් මෙසේ පැවසී යː “වමේ සහයෝගය ඉවත් කර ගැනීමකින් ප්‍රකුපිත කෙරෙන හදිසි මැතිවරනයක් අවශ්‍ය නැති සමහර පක්ෂ නායකයන් සහ ආචාර්ය සිං අතර ගැටුම තවමත් පවතින අතර එය ඉක්මනින් විසඳෙන පාටක් පෙනෙන්ට නැති බව. . . කොංග්‍රස් මූලාශ්‍ර තව දුරටත් සඳහන් කලහ.”

“කොංග්‍රස් පක්ෂය ගිවිසුම සම්බන්ධයෙන් ඔහුට සහයෝගය නොදුන්න හොත් ආචාර්ය සිං අගමැති තනතුරෙන් ඉල්ලා අස්වීමට කැමැති වනු ඇත. කෙසේ වෙතත්, ආචාර්ය සිං හා පක්ෂය අතර සාකච්ඡා දිගට ම යන අතර අවසන් තීන්දුව තවමත් ප්‍රකාශයට පත් කෙරී නැත.”

බලාපොරොත්තු විය හැකි ලෙසට ම, කොංග්‍රස් පක්ෂ නායකත්වය විසින් මෙම වාර්තාව තරයේ ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත.

ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුමේ අවසානය ලගා වී ඇති බවටත් එක්සත් ජනපද වානිජ ලේකම් කාර්ලොස් ගුටිරෙස්ගේ වචනවලින් කිය තොත්, “දැඩි තෝරා ගැනීමක්” සඳහා ඉන්දියාවට කාලය එලඹ ඇති බවටත් බුෂ් පාලනාධිකාරය තුල හා ඒ වටා සිටින පුද්ගලයන් විසින් මෑත දී කරනු ලැබූ නිවේදන මගින් යූපීඒ ආන්ඩුව අර්බුදයේ හෙලනු ලැබ ඇත යන්න අවිවාදිත ය.

වාම පෙරමුනේ ප්‍රධාන පක්ෂය වන ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂයේ (සීපීඑම්) ඉහල නායකයන් ද යූපීඒ ආන්ඩුව හා කොංග්‍රසය ද අතර හමුවීම් මාලාවකින් පසුගිය සතිය පිරී පැවතුනි. මෙම සාකච්ඡාවල දී ආන්ඩුවේ ප්‍රධාන නියෝජිතයා වී ඇත්තේ, එහි දෙවැනි බලගතුම අමාත්‍යවරයා ලෙස පොදුවේ සැලකෙන විදේශ ඇමති ප්‍රනාබ් මුඛර්ජී ය.

ඉන්දියාවේ සිවිල් න්‍යෂ්ටික කර්මාන්තය ජාත්‍යන්තර පරමානුක බල ශක්ති ඒජන්සියේ (අයිඊඊඒ) අධීක්ෂනය යටතේ තබනු පිනිස ආන්ඩුව සහ අයිඊඊඒ අතර ඇති කර ගැනෙන ගිවිසුමකට අනුමැතිය ලබා ගනු වස් අයිඊඊඒ වෙත යාමට තමන්ට ඉඩ දෙන ලෙස ආන්ඩුව කර ඇති ඉල්ලීම සලකා බැලීමට යූපීඒ-වාම සම්බන්ධීකරන කමිටුව පසුගිය බදාදා හමුවීමට නියමිතව තිබුනි. ඉන්දු-එක්සත් ජනපද සිවිල් න්‍යෂ්ටික ගිවිසුම ලෝක න්‍යෂ්ටික නියාමන තන්ත්‍රය තුල ඉන්දියාවට සුවිශේෂ තත්වයක් -- එනම්, න්‍යෂ්ටික අවි ප්‍රසාරනය වැලැක්වීමේ ගිවිසුමට අයත් නොවන එහෙත් සිවිල් න්‍යෂ්ටික වෙලඳමේ යෙදීමට අවසර ලැබෙන න්‍යෂ්ටික අවි සහිත රාජ්‍යයක් -- ප්‍රදානය කරනු ඇති බැවින් එය බලාත්වීමක වීමට අයිඊඊඒ හා න්‍යෂ්ටික සැපයුම් කන්ඩායම (එන්එස්ජී) සමග සාකච්ඡා කොට ගිවිසුම් අනුමත කර ගැනීමක් ඇතුලු පියවර ගනනාවක් අවශ්‍ය කෙරෙයි.

නමුත් සම්බන්ධීකරන කමිටු රැස්වීම සඳහා වූ සූදානම් වීමේ සාකච්ඡා මගින් පැහැදිලි වූයේ ආන්ඩුව සහ වාම පෙරමුන අතර මතභේදය නිරාකරනය කර ගත නොහැකිව සිරවීමක පවතින බව යි. "ඉන්දියාවට සුවිශේෂ වූ අයිඊඊඒ ආරක්ෂක විධිවිධාන ගිවිසුම" නියමාකාරයෙන් තක්සේරුවට ලක් කිරීමට තමන් තවමත් අපොහොසත්ව ඇති බවත් බුෂ් පාලනාධිකාරය විසින් නියම කරන ලද කාල සටහනක් අනුගමනය කිරීමට තමන් සූදානම් නැති බවත් වාම පෙරමුනේ නායකයෝ පැවසූහ.

"ආරක්ෂක විධිවිධාන" ගිවිසුම පිලිබඳව තමන් වාම පෙරමුනට පුලුල් විස්තරකථනයක් සපයා ඇති බවට ආන්ඩුව කියාපාන නමුත් එම ගිවිසුමේ පිටපතක් සැබැවින්ම ඔවුන්ට කියවීමට දීම එය ප්‍රතික්ෂේප කර සිටී.

සම්බන්ධීකරන කමිටු රැස්වීමට යන්තම් පැය ගනනාවකට පෙර, ආන්ඩුව එය අවලංගු කලේ ය. ඔවුන් ඒ සඳහා යොදා ගත් කඩතුරාව වූයේ සිරියානු ජනාධිපති බෂාර් අල්-අසාද්ගේ සංචාරය හේතු කොට ගෙන එයට අදාල වැඩකටයුතුවල යෙදීමට මුඛර්ජීට සිදු වනු ඇත යන්න යි.

එය අවලංගු කිරීම සඳහා වූ සැබෑ හේතුව වන්නේ, ආන්ඩුව, නැත හොත් එයට නායකත්වය දෙන කොංග්‍රස් ඇමතිවරු කිහිපදෙනෙකුගෙන් සමන්විත කුඩා කල්ලිය, සහ සෝනියා ගාන්ධි හා කොංග්‍රස් පක්ෂ නායකත්වය හිස ගිනි ගත්තවුන් මෙන් තමන් ඉදිරියේ ඇති විකල්පයන් මොනවාද යන්න ගැන සොයන බව යි.

කාරනා හතරක් ඔවුන්ගේ ගනන් බැලීම්වලට කේන්ද්‍රීය වී තිබේ.

පලමුවෙන් ම, හදිසි මැතිවරනයක් පිලිබඳ තර්ජනය ඉවත් කර ගන්නා ලෙස ස්ටැලින්වාදීන්ට බල කිරීමට ඔවුන්ට හැකි වේද?

අන් සියල්ලට මත් වඩා, වාම පෙරමුනේ නායකයෝ ම මැතිවරන සම්බන්ධනේ බියක් දක්වති. ඒ හේතු දෙකක් නිසා ය. යූපීඒ ආන්ඩුව ඔවුන්ගේ පාර්ලිමේන්තු සහාය මත යැපීමෙහි ප්‍රතිඵලයක් ලෙස දැන් ඔවුන් භුක්ති විඳින ආනුභාවය මැතිවරනයක් නිසා ඔවුන්ට අහිමි වී යා හැකි නිසා සහ ඔවුන් ආයෝජන-හිතැති පිලිවෙත් අනුගමනය කිරීම හේතුවෙන් ඔවුන්ගේ බටහිර බෙංගාල බලකොටුව තුල මහජන විරෝධී ප්‍රතිප්‍රහාරයක් ඇවිලීම සම්බන්ධයෙන් ඔවුන් භීතියට පත්ව ඇති නිසා ය.

පසුගිය පතන සෘතුවේ දී, විශේෂ ආර්ථික කලාප වෙනුවෙන් ඉඩම් පවරාගැනීමේ බටහිර බෙංගාල වාම පෙරමුනු ආන්ඩුවේ පිලිවෙතට ප්‍රතිරෝධය දැක්වූ නන්දිග්‍රාම් ගොවි ජනයාට එරෙහිව සීපීඑම් මැර ගුන්ඩන් මිනීමරු ප්‍රහාරයක් එල්ල කිරීමෙන් යන්තම් දින කිහිපයකට පසුව, වාම පෙරමුන, යූපීඒ ආන්ඩුව අයිඊඊඒ සමග සාකච්ඡා ඇරඹීමට තමන් දැක්වූ විරුද්ධත්වය ඉවත් කර ගත්තේ ය.

දෙවනුව, තමන් එක්සත් ජනපද අධිරාජ්‍යවාදී උගුලක් ලෙස හෙලා දුටු ගිවිසුමක් සම්මත කරනු පිනිස වාම පෙරමුන යලිත් ඉඩකඩ සැලසුව හොත් එහි කීර්තියට තව දුරටත් වල කැපෙනු ඇති බැවින් එය අයිඊඊඒ සමග ආරක්ෂක විධිවිධාන ගිවිසුමට යටත් වීමට දිගට ම විරුද්ධ වුන හොත් කොංග්‍රසය ඔවුන්ගේ එම විරුද්ධත්වය නොතකා ක්‍රියා කල යුතු ද? හැකි නම් ආන්ඩුව බිඳ හෙලන ලෙස එය ස්ටැලින්වාදීන්ට අභියෝග කල යුතු ද?

තෙවනුව, යූපීඒ තුල සිටින කොංග්‍රසයේ සගයන් එවන් සුදුවක අවශ්‍යතාව ගැන පොලඹවා ගත හැකි ද?

සිවුවනුව, ස්ටැලින්වාදීන් ආන්ඩුවට දෙන සිය සහයෝගය ආකාරගත ලෙස ඉවත් කර ගත හොත්, ආන්ඩුවට විරුද්ධ විශ්වාසභංග යෝජනාවකට ඡන්දය

දීමට හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂය (බීජේපී) සමග අත්වැල් බැඳ ගැනීම ඔවුන් කෙසේ වෙතත් ප්‍රතික්ෂේප කරනු ඇති ද? ආන්ඩුවට බලයේ රැඳී සිට ඊලග වසරේ මැතිවරනය සඳහා දින නියම කිරීමෙහි ලා මූලිකත්වය ගැනීමට හැකියාව සලසන එවන් මාවතක් තමන් අනුගමනය කිරීමට ඉඩ ඇති බවට වාම පෙරමුනු නායකයන් අගවා ඇත.

ඊලග යූපීඒ-වාම සම්බන්ධීකරන කමිටු රැස්වීමේ දී හෝ එයින් ක්ෂනික ඉක්බිතිව කොංග්‍රසයට සිය පිලිවෙත කුමක් ද යන්න එලිදරව් කිරීමට සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම රැස්වීම දැන් ඊලග සතියේ මැදට යලි යොදා ගෙන ඇත.

ඉන්දියාවේ සංගත ප්‍රභූව මේ ප්‍රශ්නය පිලිබඳව තමන්ගේ ආස්ථානය කුමක් ද යන්න සම්බන්ධයෙන් කිසිදු සැකයකට ඉඩක් තබා නැත. ආන්ඩුව වැටීමට හේතු වුනත්, වාම පෙරමුනේ බොරු තර්ජන ගනන් නොගන්නා ලෙස කොංග්‍රස් නායකත්වයෙන් යුත් යූපීඒ ආන්ඩුවෙන් ඉල්ලා සිටින කතුවැකිවලින් පුවත්පත් පිරී තිබේ.

ඉන්දියාවේ ව්‍යවස්ථාව යටතේ ආන්ඩුවට ගිවිසුම් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත යන කාරනාව කතුවැකි අදහස් දැක්වීම් බොහොමයක් අවධානයට ලක් කොට තිබේ. මෙයින් අදහස් කෙරෙන්නේ, අයිඒඊඒ හා එන්එස්ජී සමග ගිවිසුම් තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය සහ එක්සත් ජනපදය සමග සිවිල් න්‍යෂ්ටික ගිවිසුම අවසානයේ ප්‍රකාශයට පත් කිරීම පවා, සුලුතර ආන්ඩුවක් හෝ භාරකාර (මැතිවරන) ආන්ඩුවක් යටතේ පවා සිදු කල හැකි ය යන්න යි.

ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම ක්‍රියාවට දැමීම පිනිස ඉදිරියට යන ලෙස, *ටයිම්ස් ඔෆ් ඉන්දියා* පත්‍රය, සිකුරාදා සිය ප්‍රධාන කතුවැකිය තුල, කොංග්‍රස් නායකත්වයෙන් යුත් යූපීඒ ආන්ඩුවෙන් බලගතු ලෙස ඉල්ලා සිටියේ යː "දැන් එය බලයේ සිටින අවසාන දිනය වන ජනවාරි 19 දා තෙක් ම එක්සත් ජනපද කොංග්‍රස් මන්ඩලය තුලින් න්‍යෂ්ටික ගිවිසුම අනුමත කර ගැනීම පිනිස තමන් අඛන්ඩව ක්‍රියා කරන බවට එක්සත් ජනපද පාලනාධිකාරය ඇගවුම් කර ඇති තතු යටතේ යූපීඒ ආන්ඩුවට වම සමග එකගතාවකට පැමිනීම තව දුරටත් කල් දැමිය නොහැක. ඒ මක් නිසා ද යත් කාල සීමාව කෙටි බැවිනි. . ." ගිවිසුම කඩාකප්පල් වීමට වම කැමති වනු ඇත. එහෙත් තමන් එසේ කරනු දකිනු ලැබීමට එය කැමති වනු නැත. තමන් වහාම ආන්ඩුව බිඳ දමන බවට, බොහෝ ආකාරවලින්, එය කියා නැත. "එය වනාහි ආන්ඩුව යොදා ගත යුතු අවස්ථාවකි. වම ආන්ඩුවේ ක්‍රියාකාරී හවුල්කරුවෙක් නොවේ, එහි ක්‍රියාවන් බොහොමයකට විරුද්ධ වන ගමන්, තමන් පිටත සිට ආන්ඩුවට සහාය දෙන බවට වම කියාපානවා පමනි. . ." ඉකොනොමික් ටයිම්ස් පත්‍රයේ සිකුරාදා කතුවැකියේ මාතෘකාව වූයේ "වමේ බොරු තර්ජන නොතකා ක්‍රියා කිරීමට කාලය එලඹ තිබේ" යන්න යි. එය මෙසේ ආරම්භ වියː "වමේ සහයෝගය අහිමි වීමේ අවදානම දරා ගෙන වුවත් න්‍යෂ්ටික ගිවිසුම ඉදිරියට ගෙන යාමට පක්ෂව අගමැති මන්මෝහන් සිං සහ කොංග්‍රස් සභාපතිනි සෝනියා ගාන්ධි යන දෙදෙනාම බලගතු ලෙස අදහස් දක්වා තිබේ. මුලුමනින් ම ඉන්දියාවේ අවශ්‍යතාව වෙනුවෙන් පවතින න්‍යෂ්ටික ගිවිසුම සම්බන්ධයෙන් වම කරන තර්ජන නොතකා ක්‍රියා කිරීමේ මෙම ප්‍රයත්නය අපි සාදරයෙන් පිලිගනිමු."

කතුවැකිය සමාප්ත කර ඇත්තේ ද ඊට සමාන ප්‍රකාශයකිනිː "ඉන්දියාවේ අවශ්‍යතාව වෙනුවෙන් කල යුතු දේ වෙනුවෙන් පෙනී සිටීමෙහි ලා පවත්නා සිය අධිෂ්ඨානය ප්‍රදර්ශනය කිරීමට කොංග්‍රසයට අවස්ථාවක් ලැබී ඇත. ආන්ඩුව න්‍යෂ්ටික ගිවිසුම සමග ඉදිරියට ගොස් ජාතික අවශ්‍යතා වැඩි දියුනු කරන මූලික කාරනා සම්බන්ධයෙන් තමන් සම්මුති නොගසන බවට සංඥා කල යුතුය. වම සහයෝගය ඉවත් කල ගත හොත් එසේ වුනාවේ. නියමිත කලට මාස කිහිපයකට පෙර මහ මැතිවරනය පවත්වනු ලැබුවා වුනත් එය මුහුන දීමට තරම් වටනා අවදානමකි."

## ඉන්දියානු ප්‍රභූව ලෝක බලවතකුගේ තත්වයට ඉව අල්ලයි

ඉන්දියාවේ සංගත සහ මිලිටරි-විදේශ පිලිවෙත් ප්‍රභූ කොටස් හේතු ගනනාවක් නිසා ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුමට බලගතු ලෙස සහයෝගය දක්වති. එය ලෝක න්‍යෂ්ටික නියාමන තන්ත්‍රය තුල අනන්‍ය තත්වයක් ද න්‍යෂ්ටික අවි සහිත රාජ්‍යයක් ලෙස තථ්‍ය සමාන පිලිගැනීමක් ද ඉන්දියාවට ලබා දෙනු ඇත. වැඩි දියුනු සිවිල් න්‍යෂ්ටික තාක්ෂනයට ප්‍රවිෂ්ටයක් ලබා ගැනීමෙන් ආයාත තෙල් හා ස්වාභාවික ගෑස් මත සිය රඳා පැවැත්ම අඩු කර ගැනීමට ඉන්දියාවට ඉඩ ලැබෙන අතර එක්සත් ජනපදය සමග මිලිටරි හා සෙසු අධි-තාක්ෂන වෙලඳම සඳහා ද මාවත විවෘත කෙරෙනු ඇත. එමෙන් ම සිය ස්වදේශීය න්‍යෂ්ටික වැඩපිලිවෙලෙහි සම්පත් ස්වකීය "මූලෝපායික ආරක්ෂක ව්‍යාපෘතිය" එනම්, සිය න්‍යෂ්ටික අවි වැඩපිලිවෙල වර්ධනය කිරීම පිනිස සංකේන්ද්‍රනය කිරීමේ හැකියාව ද ඉන්දියාවට ලැබෙනු ඇත.

අවසන්, එහෙත් වැදගත්කමින් අඩු නොවන, කාරනාව නම්, ඉන්දියානු ප්‍රභූව, වොෂිංටනය සමග වරප්‍රසාදිත සබඳතාවක් එනම්, "ගෝලීය මූලෝපායික හවුල්කාරිත්වයක්" තහවුර කර ගැනීමේ අවස්ථාවක් ලෙස ඉන්දු-එක්සත් ජනපද සිවිල් න්‍යෂ්ටික ගිවිසුම

සැලකීම යි. ඉන්දියාවට ලෝක බලයක් බවට පත්වීමට උදව් කිරීමට එක්සත් ජනපදයට අවශ්‍ය බවට එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් සිදු කර ඇති ප්‍රසිද්ධ ප්‍රකාශය වැනි එවන් කියාපෑම් මගින්, නිශ්චිතව ම, බුෂ් පාලනාධිකාරය ඉන්දියාව ආකර්ෂනය කර ගැනීමට උත්සාහ දරා තිබේ.

ඉන්දියාවේ සංගත ප්‍රභුව අපෙක්ෂාභංගත්වයට පත් කරමින්, රටේ නිල විපාර්ශ්වය වන බීජේපීය ගිවිසුමට සහයෝගය දැක්වීම ප්‍රතික්ෂේප කර තිබේ. ඒ ජාතික ප්‍රජාතන්ත්‍ර සන්ධාන සභාගයේ නායකත්වය ලෙස එය බලයේ සිටිය දී යූපීඒ ආන්ඩුව හා බුෂ් පාලනාධිකාරය සාකච්ඡා කර ඇති ගිවිසුමට බෙහෙවින් සමාන ගිවිසුමක් එය එක්සත් ජනපදයට යෝජනා කර තිබීම ද නොතකා ය. න්‍යෂ්ටික ගිවිසුමට බීජේපීය දක්වන විරුද්ධත්වය වනාහි යූපීඒ ආන්ඩුව බලයට පැමිනි අවස්ථාවේ පටන් මේ දක්වා ම එය ගෙන ඇති අතිශයින් ප්‍රකෝපකාරී, ගැටුම්කාරී ආස්ථානය ඉදිරියට ගෙන යාමකි.

බීජේපීය ගිවිසුමට දක්වන සිය විරුද්ධත්වය කේන්ද්‍රගත කර ඇත්තේ, එය සිය න්‍යෂ්ටික අවි වැඩපිලිවෙල වර්ධනය කිරීමේ ඉන්දියාවේ හැකියාව සීමා කරනු ඇත යන පදනම මත ය. ඒ, ඉන්දියාව තව න්‍යෂ්ටික අවියක් අත්හදා බැලුව හොත් වොෂිංටනයට ගිවිසුම අවලංගු කොට තමන් විසින් සපයනු ලැබ ඇති න්‍යෂ්ටික තාක්ෂනය හා ඉන්ධන මුලමනින් ම ආපසු දෙන ලෙස ඉල්ලා සිටීමට හැකි බවට ගිවිසුමට අනුමැතිය දෙන එක්සත් ජනපද පනත (හෙන්රි හයිඩ් පනත) මගින් බලය පැවරෙන බැවිනි.

වාම පෙරමුන, සිය පාර්ශ්වයෙන්, චෝදනා කර ඇත්තේ, වොෂිංටනයේ එල්ලය සිය කොල්ලකාරී ගෝලීය අභිලාෂයන්ට ඉන්දියාව සම්බන්ධ කර ගැනීම බවට සහ ගිවිසුම ශීඝ්‍රයෙන් වර්ධනය වන ඉන්දු-එක්සත් ජනපද මිලිටරි හා මූලෝපායික සහයෝගිතාවයේ -- ඉන්දියාව එක්සත් ජනපදය මත යැපෙන තත්වයකට පත් කර ගැනීමට වොෂිංටනය යොදා ගන්නා සහයෝගිතාවයේ -- සන්දර්භය තුල තැබිය යුතු බවට ය.

චීනය හීලෑ කිරීමේ, අවශ්‍ය නම්, චීනය ප්‍රතිමුඛ කිරීමේ වොෂිංටනයේ පිලිවෙත්වල ආයුධයක් බවට ඉන්දියාව පත්වීමේ තර්ජනයක් නැති බවට කියාපාන අයට ප්‍රතිචාර වසයෙන් වාම පෙරමුනු නායකයන් පෙන්වා දෙන්නේ, ඉරානය සම්බන්ධයෙන් වොෂිංටනයේ මාවත අනුගමනය කිරීමට ඉන්දියාවට තර්ජනාත්මකව බල කරනු පිනිස ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම යොදා ගැනීමට බුෂ් පාලනාධිකාරය හා එක්සත් ජනපද කොංග්‍රස් නායකයන් උත්සාහ කර ඇති ආකාරය යි.

එහෙත්, අනෙක් අතට, යූපීඒ ආන්ඩුව සමාජීයව ගිනි අවුලුවන සුලු නව-ලිබරල් ආර්ථික න්‍යාය පත්‍රයක් අනුගමනය කරන බව පිලිගන්නා ගමන් පවා, වාම පෙරමුන එම ආන්ඩුවට බලගතු ලෙස සහාය දීමේ පිලිවෙත දිගට ම ගෙන යයි.

සීපීඑම් ප්‍රධාන ලේකම් ප්‍රකාශ් කරාට් මේ සතියේ අග මෙසේ පැවසී යː" මම . . . බලාපොරොත්තු වෙන්නේ, ආන්ඩුව සිය මුලු පාලන කාලය අවසන් වන තෙක් බලයේ සිටිනු ඇති බවට යි. අපි බැරෑරුම් ප්‍රයත්නයන් දරමින් සිටිනවා. කලකට පෙර අගමැතිතුමා කියා තිබුනා අපි එක කාරනාවක් මත පදනම් වෙච්ච ආන්ඩුවක් නොවේ කියා. . . . අපි බලාපොරොත්තු වෙනවා ආන්ඩුව සිය පොරොන්දුව ඉටු කරාවි කියලා."

© www.wsws.org